## කලම්බු කොමර්ෂල් ෆර්ටිලයිසර්ස් ලිමිටඩ් - 2015

-----------------------------------------------------------------

කලම්බු කොමර්ෂල් ෆර්ටිලයිසර්ස් ලිමිටඩ්හි 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සමාගමේ සභාපති වෙත 2016 ඔක්තෝබර් 27 දින විස්තරාත්මක වාර්තාවක් නිකුත් කරන ලදි.

### 1.2 සමාගම පිහිටුවීම

---------------------

කලම්බු කොමර්ෂල් ෆර්ටිලයිසර්ස් ලිමිටඩ් 1872 වර්ෂයේදී සමාගමක් ලෙස ලියාපදිංචි කර 1872 සිට 1976 වර්ෂය දක්වා ශතවර්ෂයකට අධික කාලයක් මහා බ්‍රිතාන්‍ය පාලනය යටතේ සිදුකරන ලදී. 1971 අංක 35 දරන ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ 1976 වර්ෂයේදී රජයට පවරාගත් අතර සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම නමින් නිසි බලධාරියෙකු යටතේ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන ලදී.

1987 අංක 23 දරන රජයට පවරා ගත් ආයතන පොදු සමාගමක් බවට පත්කිරීමේ පනතින් රාජ්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී. 1994 රජයේ ප්‍රතිපත්තියට අනුව පෞද්ගලීකරණය කර ඇති අතර 1996 අංක 29 දරන රාජ්‍ය ව්‍යාපාර පුනරුත්ථාපනය කිරීමේ පනත යටතේ 1997 දී නැවත පවරා ගෙන රේඛීය අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ පාලනය වෙමින් පවතී. වර්තමානයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී,

අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2016 මාර්තු 31 දිනට කලම්බු කොමර්ෂල් ෆර්ටිලයිසර්ස් ලිමිටඩ්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 ප්‍රකාර ආයු ගණන ලාභාලාභ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ඇතුළත්කළ යුතු වුවත් සමාගම විසින් රු.108,697,211 ක් වූ ආයු ගණන ලාභාලාභ සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාර ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සංශෝධනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.38,318,368 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

පොහොර ප්‍රවාහනය සඳහා ලබාදුන් රු.200,000 ක් වූ අත්තිකාරම් සේවය ලබාගැනීමෙන් පසුවත් තවදුරටත් අත්තිකාරම් ලෙස දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළ උපචිත ප්‍රවාහන වියදම් වූ රු. 273,473 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ප්‍රවාහන වියදම් රු.473,473 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ණයගැති ශේෂය, විගණනය සඳහා ඉදිරිපත් කළ උපලේඛනය සමග සැසඳීමේදී රු.1,478,241 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් කාලයේ සිදුවූ තොග හානිවීම් හා නැතිවීම් සම්බන්ධ ගැලපීම් සිදුකර නොතිබීම හා සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන පොහොර ගබඩාව භෞතිකව සත්‍යාපනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොත් ශේෂය වූ රු.557,757,172 ක තොගයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයට පෙර පැවති රු.47,254,730ක වෙළඳ ණයගැති ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.286,620 ක් පමණක් අයකරගෙන තිබුණි. ඒ අනුව වසර 05කට වඩා පැරණි ණය ශේෂයන් අයකර ගැනීම ඉතාම දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) ගොවිජන සේවා මධ්‍යස්ථාන 46 සමඟ සමාලෝචිත වර්ෂය තුළ ගනුදෙනු කර තිබියදී 2015 මාර්තු 31 දිනට පොහොර මිලදී ගැනීමට අදාල ගනුදෙනුකරුවන්ගේ තැන්පතු හා වැඩිපුර ගෙවා තිබූ රු.13,360,483 ක් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 මාර්තු 31 දිනට ගොවිජන සේවා මධ්‍යස්ථාන 06 ක පැවති රු.1,738,244 ක ණය ශේෂයන් 2016 අගෝස්තු 31 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.180,971,671 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.281,645,038 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 100,673,367 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පොහොර සහනාධාර සඳහා වූ පොදු කාර්යය පිරිවැය රු.71,168,475 කින් වැඩිවීම හා වෙනත් ආදායම් රු.21,723,061 කින් අඩුවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011/2012 වර්ෂයේ දී රු.167,128,785 ක් වූ මූල්‍ය අතිරික්තය 2012/2013 හා 2013/2014 වර්ෂවලදී අඩුවීමක් පෙන්නුම් කළ අතර 2014/2015 වර්ෂයේ දී වර්ධනයක් පෙන්නුම් කෙරුණි. නැවතත් 2015/2016 වර්ෂයේදී රු.180,971,671 දක්වා අඩු වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2011/2012 වර්ෂයේදී රු.322,750,857 ක් වූ එකතුකළ අගය 2012/2013, හා 2013/2014 වර්ෂවලදී අඩුවීමක් පෙන්නුම් කළ අතර 2014/2015 වර්ෂයේදී වැඩිවී නැවතත් 2015/2016 වර්ෂයේදී රු.350,816,416 දක්වා අඩුවී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 4.1 කාර්යසාධනය

------------------

පොහොර, රසායන ද්‍රව්‍ය, ඛනිජ ද්‍රව්‍ය හා වෙනත් ස්වභාවික හා කෘතිම ද්‍රව්‍යයන් නිමි හා නොනිමි ස්වරූපයෙන් එකී ද්‍රව්‍ය නිෂ්පාදන සඳහා වෙනත් අමුද්‍රව්‍ය, ඒජන්තවරුන්, ආනයනකරුවන්, අපනයනකරුවන්, බෙදාහරින්නන් හා වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාමත්, ඒවා ප්‍රති අපනයනය කිරීම පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය හා අනෙකුත් අමුද්‍රව්‍ය ඕනෑම ස්වරූපයකින් පොහොර අපනයනය කිරීමත්, නියෝජිතයන් ලෙස ක්‍රියාකිරීම සහ ආනයන අපනයන ඇසුරුම් කටයුතු සිදුකිරීම සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සමාගමේ අරමුණ වේ.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකල විගණන පරීක්ෂණයේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.
සහනාධාර ක්‍රමය යටතේ සමාගමට ලැබුණු භාණ්ඩාගාර ප්‍රදාන 2016 පෙබරවාරි 29 වන දින සිට ඉවත් කර ඇති බැවින් අනාගත ව්‍යාපාරික අවධානමට මුහුණදීම සඳහා සමාගම විසින් පූර්ව සැලසුම් පිලියෙළ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. SWOT විශ්ලේෂණය (Strengths and weaknesses in the organization and the external tiers and opportunities) හා ප්‍රමුඛතා ලබා දිය යුතු පොහොර වර්ග මගින් විකුණුම් වර්ධනය කරගැනීම සඳහා සැලසුම් පිළියෙළ කිරීම හා රසායනික පොහොර භාවිතය වෙනුවට කාබනික පොහොර යෙදීමට පෙළඹවීම තුළින් විකුණුම් ප්‍රවර්ධනයට කටයුතු කර නොතිබුණු අතර විකුණුම් වර්ධනය කරගැනීම සඳහා අනාගත ව්‍යාපාරික සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

ආනයනික පොහොර තොග මෙරටට ළඟාවීමෙන් පසු අදාළ ප්‍රවාහන සමාගම/ නියෝජිත විසින් එම තොගය හුණුපිටිය හා අනෙකුත් ගබඩා වලට ප්‍රවාහනය කිරීමෙන් පසු සමාගම විසින් ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත පොහොර සාම්පල් ලබා දෙන නමුත් ඒ සඳහා නිකුත් කරනු ලබන වෙළඳ ලිපිය (Marketing Letter) ලැබෙන තුරු පොහොර අලෙවි කළ නොහැකි වේ. පරීක්ෂා කල නියැදියට අනුව UREA, MOP, TSP, පොහොර වර්ග අවස්ථා 27ක දී වෙළඳ ලිපිය ලැබීමට මාස 01 සිට මාස 07 ක කාල පරාසයක් ගතවීම නිසා තොග නඩත්තු කිරීම සඳහා අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

### 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මිට්ෂුබිසි පැජරෝ රථයක් අපහරණය කිරීමේ දී මිල ගණන් 04 ක් ලැබී තිබුණු අතර එහි උපරිම මිල රු.1,635,950 ක් හා දෙවන මිල රු.1,430,000 ක් විය. එහෙත් උපරිම මිල ගණන් ඉදිරිපත් කළ පුද්ගලයෙකු විසින් වාහනයේ මුල් ලියාපදිංචි සහතිකය (Original) ලැබේ නම් පමණක් එම මිලට මිලදී ගන්නා බවත් පිටපතක් (Duplicate) ලැබේ නම් මිලට ගත නොහැකි බව 2015 මැයි 07 දින ලිපියකින් දන්වා තිබුණි. ඒ අනුව සමාගම විසින් ලියාපදිංචි සහතිකයේ මුල්පිටපත (Original) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා නොගැනීම නිසා ඊළඟ මිල වූ රු.1,430,000 ක මිලට විකිණීමට සිදුවී තිබුණි. මේ හේතුවෙන් වාහනය විකිණීමෙන් ලද හැකිව තිබූ රු.205,950 ක මුදලක් සමාගමට අහිමි වී තිබුණි.

(ආ) 2015 ජූනි 19 දිනැති 49 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ 421 අනුව 1994 වර්ෂයේ පැවති ණය ශේෂයන්ගෙන් අයකර ගැනීමට නොහැකි රු.16,177,108 ක ණය අයකර ගැනීම උදෙසා මූල්‍ය සමාගමකට පැවරීමට තීරණය කර තිබුණ ද මේ වන තෙක් ඒ සඳහා පියවරගෙන නොතිබුණි.

(ඇ) සමාගමේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රධාන ගබඩා සංකීර්ණය පිහිටා ඇති හුණුපිටිය ඉඩම හෙක්ටයාර් 4.832 ක් හා හෙක්ටයාර් 1.176 ක් වශයෙන් කොටස් දෙකකින් සමන්විත රජයේ ඉඩමක් වන අතර මෙතෙක් එහි අයිතිය සමාගමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නෑගම පොහොර ගබඩාවේ අළුත්වැඩියා කටයුතු සඳහා රු. 3,704,000ක් ඇස්තමේන්තු කර තිබුණු අතර මේ සඳහා රු.3,551,207ක් වැයකර තිබුණි. මේ පිළිබඳව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අළුත්වැඩියා කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණි.

(ii) කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව උපකොන්ත්‍රාත්තු සඳහා ප්‍රතිපාදන සළසා නොතිබියදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සේවායෝජකගේ අනුමැතියකින් තොරව අළුත්වැඩියාව පෞද්ගලික සමාගමකට පවරා තිබුණි.

(iii) ඇස්තමේන්තු ප්‍රමාණ පත්‍රය අනුව විෂයයන් 09 ක ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කර තිබුණු අතර විෂයයන් 10 ක කාර්යයන් ඉටුකර නොතිබුණි. ඒ අනුව ඇස්තමේන්තු සකස්කිරීමේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරක්ෂක සේවා සඳහා පෞද්ගලික ආයතනයකට රු.10,384,040 ක් ගෙවා තිබුණු අතර එම ආරක්ෂක සේවාව සපයන ලද ආයතනයටම 2015 අගෝස්තු 15 දින සිට නැවත වරක් ප්‍රසම්පාදනය දීර්ඝ කර ලබාදී තිබුණි. ඒ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සහකාර පරිපාලන කළමනාකාරිණිය විසින් අවස්ථා ගණනාවකදී එම ආරක්ෂක සේවා ආයතනයේ සේවය අසතුටුදායක බව ලිඛිතව දන්වා තිබූ අතර 2015 නොවැම්බර් 10 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණයට අනුව 2015 දෙසැම්බර් 01 දිනැති ලිපිය මගින් ඔවුන්ගේ සේවාව අත්හිටුවීමට දැනුම්දී ඇතත් අවස්ථා 04 කදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කාලය දීර්ඝ කර එම ආයතනයේ සේවය ලබා ගෙන තිබුණි.

(ii) 2015 ජූලි 18 දිනැති අංක සීඑස්ඩී /1/12/6(298) දරන "සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව ආරක්ෂක හා ව්‍යාපෘති රාජකාරී වල යෙදවීම" මැයෙන් නිකුත් කර තිබූ ලිපියට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ආරක්ෂක නිලධාරීන් ලබා ගැනීමට සියළුම කටයුතු සංවිධානය කර තිබුණද එම ආයතනය විසින් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක කාර්යසාධන බැඳුම්කරයක් තැබීමට අපොහොසත් වීම මත මෙම ආයතනයෙන් ආරක්ෂක නිලධාරීන් බඳවා ගැනීම අත්හිටුවා දිගින් දිගටම ඉහත ආයතනයෙන්ම ආරක්ෂක නිලධාරීන් සේවයේ යොදවා තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නැගම පොහොර ගබඩාවේ 2008 පෙබරවාරි මාසයේදී සිදුවී තිබූ රු.105,000 ක මූල්‍ය අක්‍රමිකතාවය පිළිබඳ මූලික පරීක්ෂණ පවත්වා නොතිබූ අතර බදුල්ල ප්‍රාදේශීය ගබඩාවේ 2006 පෙබරවාරි මාසයේ දී සිදුවී තිබූ රු.1,688,000 ක තොග ඌනතාවයට අදාළව මූලික විමර්ශන පවත්වා නොතිබීම හේතුවෙන් වගකිව යුතු පාර්ශව හඳුනාගෙන එම අලාභ අයකර ගැනීම සඳහා 2016 ජූනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) දෙහිඅත්තකණ්ඩියේ ප්‍රාදේශීය ගබඩාවේ ගබඩා භාරකරු 2012 වර්ෂයේදී රු.1,903,555ක මුදලක් අයථා ලෙස භාවිත කිරීමෙන් සමාගමට සිදුවූ අලාභය අයකරගැනීමට නීතිමය කටයුතු සිදුකරමින් පැවතුන අතර හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු නොකිරීම නිසා කාලාවරෝධයට යටත් වීමෙන් අයකරගැනීමේ අවස්ථා අහිමිවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

බඳවාගැනීමේ කාර්ය පරිපාටි සංග්‍රහය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීම පත්වීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ සිදුවිය යුතු වුවත් ඊට පටහැනිව කළමනාකරණ සහකාර නිලධාරියෙකු සභාපතිගේ අනුමැතිය මත උසස් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන දින 58 ක් ප්‍රමාදවී ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් විගණන වාර්තාව නිකුත් කිරීමෙන් පසු සංශෝධිත මූල්‍ය ප්‍රකාශන දින 36 ක් ප්‍රමාදවී ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05 ඡේදය අනුව තම ව්‍යාපාර කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළයුතු බැවින් අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා චක්‍රලේඛ සංයුක්ත සැලැස්මක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව අදාළ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම විසින් එපරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) මූල්‍ය පාලනය | - | සියළු ලැබීම් හා ගෙවීම් සඳහා මුදල් පොතක් විධිමත්ව පවත්වා ගෙන නොතිබීම. |
| | - | ප්‍රාදේශීය ගබඩාවල පොහොර ගබඩාකිරීම සහ පොහොර අලෙවි කටයුතුවලදී විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම හා අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීම සඳහාද ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම. |
| (ආ) ගබඩා පාලනය | | භාණ්ඩ ලැබීම හා නිකුත් කිරීම් යාවත්කාලීනව හා විධිමත්ව සිදුනොකිරීම. |
| (ඇ) වාහන පාලනය | | එක් එක් වාහනයට අදාළ මූලික තොරතුරු ඇතුළත් කර ලොග් පොත් පවත්වා නොතිබීම. |
| (ඇ) කොන්ත්‍රාත් පාලනය | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා අදාල චක්‍රලේඛ වලට අනුගත නොවීම. |